රාජකීය විද්‍යාලයීය සිංහල භාෂා හා සාහිත්‍ය ඒකකය
Sinhala Language and Literary Unit of Royal College
රාජකීය විද්‍යාලය, කොළඹ 07.

www.සාහිත්‍ය.lk
www.sahithya.lk

www.sahithya.lk
info@sahithya.lk

සිංහල යුනිකෝඩ්කරණය, අන්තර්ජාල ජනමාධ්‍යකරණය හා සිංහල බ්ලොග්කරණය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.

මාධ්‍ය සාකච්ඡාව - 2009 මැයි 21
රාජකීය විද්‍යාලයීය සම්මන්ත්‍රණ ශාලාවේ දී

සහභාගීත්වය
අතුල පුෂ්පකුමාර - වැඩසටහන් ප්‍රධානී. සන්නිවේදන හා ජනමාධ්‍ය (ICTA)
ප්‍රියංක ආරියසුමන - ව්‍යාපෘති නිළධාරී (ICTA)

උපාලි ගුණසේකර - ගරු විදුහල්පති (රාජකීය විද්‍යාලය)
ඉන්ද්‍රා මාදුගොඩ - සිංහල භාෂා හා සාහිත්‍ය ඒකකය භාර ආචාරිණී (රාජකීය විද්‍යාලය)
සුපුන් සුදාරක - ව්‍යාපෘති නිලධාරී (රාජකීය විද්‍යාලය)
ලක්පති විජේසේකර - සභාපති. සිංහල භාෂා හා සාහිත්‍ය ඒකකය (රාජකීය විද්‍යාලය)
ලහිරු වික්‍රමසිංහ - ලේකම්. සිංහල භාෂා හා සාහිත්‍ය ඒකකය (රාජකීය විද්‍යාලය)

අප මව් බස, සිංහල භාෂාව භාවිතයෙන් තොරව අභාවයට යමින් පවතින මෙවන් යුගයක සිය ජාතික වගකීම හඳුනාගනිමින්, වගකීම වෙනුවෙන් කැපවෙමින් කොළඹ රාජකීය විද්‍යාලයීය සිංහල භාෂා හා සාහිත්‍ය ඒකකය, දේශයේ අනාගතය භාරගැනීමට දෑස් දල්වා බලාසිටින වත්මන් ශිෂ්‍ය පරපුර තොරතුරු තාක්ෂණය, ජනමාධ්‍යකරණය සහ සිංහල භාෂාව යන ත්‍රිත්වයෙන් සන්නද්ධ කරවමින්. නව ලොවට මුහුණදෙන ශක්තිමත් සිසු පරපුරක් නිර්මාණය කිරීමේ ජාතික වගකීමට මෙසේ ක්‍රියාත්මක වන වගයි.

ශ්‍රී ලංකාවේ පාසල් අතුරින් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියනු ලබන කොළඹ රාජකීය විද්‍යාලය වර්තමානය වන විට තොරතුරු තාක්ෂණය භාවිත කරමින් සිය පාසල් ශිෂ්‍යයින් සඳහා විශාල සේවාවන් රැසක් සපයමින් සිටයි. පාසල විසින් දැනට පවත්වාගෙන යනු ලබන ශිෂ්‍ය තොරතුරු කේන්ද්‍රය (www.inforoyal.com) හරහා පාසල් සිසුන්, දෙමව්පියන් හා පාසල අතර සහසම්බන්ධතාවය තීව්‍ර කරනු ලැබේ.

LÉ ROYALÉ (www.leroyale.tv) නමින් ක්‍රියාත්මක රාජකීය විද්‍යාලයේ නිල YouTube නාලිකාව හරහා රාජකීය විද්‍යාලයේ සියලුම ඉසව්වල වීඩියෝ දර්ශන අන්තර්ජාලයට එකතු කරනු ලබන අතර ක්‍රීඩා හා වෙනත් ඉසව් සජීවී ආකාරයෙන් අන්තර්ජාලය හරහා විකාශය කරනු ලැබේ. මෙහි විශේෂත්වය මෙහි සියලු කටයුතු ශිෂ්‍යයන් විසින්ම ස්වේච්ඡාවෙන් ඉටු කිරීම වේ.

මෙවැනි සුවිශේෂී තොරතුරු තාක්ෂණික වටිනාකම් රැසක් හිමිකරගත් කොළඹ රාජකීය විද්‍යාලය එම වටිනාකම් වෙනත් පාසල් වෙතද ව්‍යාප්ත වනු වස් ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා සම්බන්ධව මෙසේ ක්‍රියාත්මක වන වගයි.

# සිංහල යුනිකේතය, අන්තර්ජාල ජනමාධ්‍යකරණය හා සිංහල බ්ලොග්කරණය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.

රාජකීය විද්‍යාලයීය සිංහල භාෂා හා සාහිත්‍යය ඒකකය "අසෙනිය කුසුම" නමින් සංවිධානය කරන සාහිත්‍ය උළෙල නිමිත්තෙන් මෙවර අන්තර්ජාලයෙහි පැවැත්වෙන බ්ලොග්කරණ තරගාවලියක් සූදානම් කර තිබේ.

ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් මේ සඳහා අනුග්‍රහය ලැබෙන අතර 2009 තොරතුරු තාක්ෂණ වසර නිමිති කරගෙන මෙය පැවැත්වෙනු ඇත.

සිංහල බ්ලොග්කරුවන් ඇගයීම, සිංහල බ්ලොග් අවකාශයට තවත් බ්ලොග්කරුවන් හඳුන්වාදීම, සිංහල යුනිකේත හා අන්තර්ජාල ජනමාධ්‍යකරණය සහ සිංහල බ්ලොග්කරණය ප්‍රචලිත කිරීම මෙහි අරමුණු වේ.

දිවයින පුරා පාසල් සිසුන්, පාසැල් සහ නැණසල මධ්‍යස්ථාන සහභාගි කරගනිමින් 2009 ජූනි සිට අගෝස්තු දක්වා මෙම තරගාවලිය පැවැත්වේ. මේ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම රාජකීය විද්‍යාලයයේ සාහිත්‍ය ඒකකය මගින් සැපයෙනු ඇත. පාසල් සිසුන් වෙනුවෙන් ප්‍රධාන වැඩමුළුවක්ද, අප නියෝජිතයන් විසින් ඒ ඒ පාසල් වල වැඩමුළුද පැවැත්වෙනු ඇත.

## පාසල් අංශය

පාසල් අංශයේ තරගය සඳහා ඒ ඒ පාසල් වල පිහිටුවා ඇති සිංහල භාෂා හා සාහිත්‍ය ඒකක සම්බන්ධ කර ගැනේ. ඒ ඒ භාෂා හා සාහිත්‍ය ඒකක සඳහා අප නිල වෙබ් අඩවිය වන www.sahithya.lk හරහා උපඩොමේන නාම යටතේ වෙබ් ඉඩ ලබාදෙනු ලැබේ. එවිට ඒ ඒ භාෂා හා සාහිත්‍ය ඒකක ඔවුන්ගේ වෙබ් අඩවි (බ්ලොග් අඩවි) සිංහල යුනිකේත භාවිතයෙන් පළ කරමින් යාවත්කාල කළ යුතු වේ. මෙහි දී තෝරාගනු ලබන ජයග්‍රාහක පාසල සඳහා සම්මාන සහ විශේෂ ත්‍යාග ලබාදීමට සූදානමින් සිටියි. තනිව පුද්ගලිකව තරඟ වැදීම සඳහා කැමති පාසල් සිසුන් විවෘත අංශය ඔස්සේ තරගයට එක් විය යුතු ය.

# විවෘත අංශය

වයස අවුරුදු 12ට වැඩි ඕනෑම පුද්ගලයෙක් සඳහා මෙම තරඟ අංශය විවෘත අතර පාසල් බේදයකින් තොරව ඕනෑම පුද්ගලයෙකුට මේ සඳහා තරඟ වැදීමේ හැකියාව ඇත. පහත දැක්වෙන කාණ්ඩයන් යටතේ විවෘත අංශය යටතේ තරඟ වදිනා බ්ලොග්කරුවන් ඇගයීමට ලක් කිරීම සඳහා සම්මාන හා ත්‍යාග ප්‍රදානය කරනු ලබයි.

- පහත අංශ යටතේ බ්ලොග්කරණ (බ්ලොග්රචනා) තරඟාවලිය පැවැත්වේ
  - හොඳම බ්ලොග් අඩවිය
  - හොඳම පුද්ගලික බ්ලොග් අඩවිය (පුද්ගලික සිතුම් පැතුම්, එදිනෙදා සිදුවීම් ලියාදැක්වෙන බ්ලොග් අඩවි)
  - හොඳම විනෝදාත්මක බ්ලොග් අඩවිය (හාස්‍ය, උපහාසය උපදවන බ්ලොග් අඩවි)
  - හොඳම වින්දනාත්මක බ්ලොග් අඩවිය
    - චිත්‍රපටි
    - පරිගණක ක්‍රීඩා
    - සංගීතය
    - රූපවාහිනී
  - හොඳම තාක්ෂණික බ්ලොග් අඩවිය
  - හොඳම විද්‍යා බ්ලොග් අඩෙවිය
  - හොඳම අධ්‍යාපනික වැදගත්කමකින් යුක්ත බ්ලොග් අඩවිය
  - හොඳම සාහිත්‍ය රසයකින් යුතු බ්ලොග් අඩවිය
  - නිවැරදි ව්‍යාකරණ අඩංගු බ්ලොග් අඩවිය
  - හොඳම පාඨක ප්‍රතිචාර හිමි බ්ලොග් අඩවිය
  - හොඳම සමූහ බ්ලොග් අඩවිය

# නැණසල අංශය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විසින් දිවයින පුරා පවත්වාගෙන යනු ලබන නැණසළ ආයතන සහභාගී කරගනිමින් මෙම තරග ඉසව්ව පැවැත්වේ. ඒ ඒ ප්‍රදේශවල නැණසළ සාමාජිකයන් සහභාගී කරගනිමින් පැවැත්වෙන මෙම ඉසව්වේදී එක් නැණසල ආයතනයට එක් බ්ලොග් අඩවියක් වශයෙන් තරඟාවලියට එක් කරගනු ලැබේ. මෙහිදී එම නැණසළ ආයතනයට අදාල ප්‍රදේශයේ තාක්ෂණික දැනුමක් නොමැති, එහෙත් නිර්මාණශීලි හැකියාවන් ඇති පුද්ගලයින්ගේ නිර්මාණ එම නැණසල බ්ලොග් අඩවි හරහා එළිදක්වනු ලබන අතර. ඒ සඳහා නැණසල පරිපාලකවරුන්ගේ මූලිකත්වය ගත යුතු වේ. ජයග්‍රහණය කරනු ලබන නැණසළ ආයතන සඳහා විශේෂ ත්‍යාගයන් ලබාදීමට නියමිත වේ.

වැඩි විස්තර සඳහා

සුපුන් සුදාරක - 071 80 640 10
ලක්පති විජේසේකර – 0779483530

# Project to Promote Sinhala Unicode, Internet Journalism and Sinhala Blogging

Press Conference

21 May 2009

At Royal College Auditorium

Participation
Athula Pushpakumara - Program Head. Communications & Media (ICTA)
Priyanka Ariyasumana - Project Officer (ICTA)

Upali Gunasekara - Principal (Royal College)
Indra Madugoda - Mistress In Charge. Sinhala Language and Literary Unit (Royal College)
Supun Sudaraka - Project Officer (Royal College)
Lakpathy Wijesekara - Chairman. Sinhala Language and Literary Unit (Royal College)
Lahiru Wickramasinghe - Secretary. Sinhala Language and Literary Unit (Royal College)

-

Sinhala Language and Literary Unit of Royal College understands and undertakes the national task of empowering the present generation of students with Information Technology, journalism and Sinhala language skills, in an era in which, our mother language is on a decline due to lack of proper use.

Inheriting a profound educational tradition among Sri Lankan schools, Royal College is already providing a wide range of services to her students through information technology. Among current projects, Student Information Centre (www.inforoyal.com) enriches the inter-relationship between the students, parernst and the school.

LE ROYALE (www.leroyale.tv), the official YouTube channel of Royal college distributes various video clips of all important events of the College. In addition, it conducts live web-casts of sports events and other activities.

With such a rich background in information technology, Royal College now collaborates with Information and Communication Technology Agency in the effort of spreading and promoting the values of information technology to other schools.

# Project to Promote Sinhala Unicode, Internet Journalism and Sinhala Blogging

A blog competition will be held as a part of the literary day festival organized by the Sinhala Language and Literary Unit of Royal College. This event is sponsored by Information and Communication Technology Agency to mark the Year of Information Technology 2009. Evaluating and appraising Sinhala language bloggers, introducing new bloggers to Sinhala blogosphere, promoting Sinhala Unicode and Internet journalism are the key objectives of the event.

Competition will be held from June to August 2009 with participation of Individual students, schools and Nenasala centres island wide. Sinhala Language and Literary Unit of Royal College is prepared to provide necessary technical assistance to all participants. An initial workshop will be conducted for the participating schools and further workshops will be conducted at various locations through our representatives.

## School Division

School division will be held in collaboration with Sinhala Language and Literary Units of participating schools. Each school will be given a sub-domain of our official website www.sahithya.lk and they will be asked to update and maintain their websites (blogs) using Sinhala Unicode. Winning school will receive special awards from our sponsors. Students who wish to compete as individual bloggers must join the open division competition.

## Open Division

Individuals who are over the age of 12 are eligible to compete in the open division. Winners of open division will be awarded under following categories :

Best blog
Best personal blog (blogs that document personal thoughts and daily events)
Best humour blog (blogs filled with laughter and humor)
Best entertainment blog

- cinema
- computer games
- music
- television

Best tech blog
Best science blog
Best educational blog
Best literature blog
Blog with best grammatical skills
Blog with highest reader appraisal and comments
Best group blog

# Nenasala Division

This division will be conducted in collaboration with Nanasala centres around the island with participation of Nenasala members. One blog from each Nenasala centre will be added to the competition. Nenasala administrators will be asked to publish creative works done by creative writers who live in respective regions through these blogs. Winning Nenasala centre will receive special awards.

For further information, contact:

Supun Sudaraka 071 806 4010
Lakpathi Wijesekara 077 948 3530